# 2 දෙවිඳුන් අබියස දැහැමිකම "දවිත්"

1 සාමුවෙල් 24 : 1-22, 2 සාමුවෙල් 9 : 1-13

ප්‍රේමය

දම්වැලක පුරුක් මෙන් ශුද්ධ බයිබලයේ අඛණ්ඩ ව දිවෙන තේමාවකි "ප්‍රේමය." දේව ප්‍රේමය මිනිසා අත්දුටු ආකාරය පැරණි ගිවිසුම හා නව ගිවිසුම අධ්‍යයනය කිරීමෙන් අපට අවබෝධ කර ගත හැකි වේ.

මෙම පාඩමෙන් අප අත්දකින්නට යන්නේ පැරණි ගිවිසුමෙහි සඳහන් වන වෘත්තාන්තයක් ඇසුරින් දෙවියන් වහන්සේ අපේක්ෂා කරන ලෙසට සතුරාට ද ප්‍රේම කරමින් ආදර්ශය දැක්වූ අසමසම චරිතයක් පිළිබඳ ව ය.

**විමසා බලමු**
**දවිත් එන්ගෙදියේ දී සාවුල් මිදීම**
**1 සාමුවෙල් 24 : 1 - 22**
**දවිත් රජ හා මෙපිබෝෂෙත්**
**2 සාමුවෙල් 9 : 1 - 13**

ඔබ විසින් විමසා බලන ලද ඉහත බයිබල් කොටස් දෙකෙහි වැදගත් සිදුවීම් සංක්ෂිප්ත ලෙස නැවත මෙලෙස හඳුනා ගනිමු.

## දවිත් එන්ගෙදියේ දී සාවුල්ගේ ජීවිතය ගැලවීම

- ඊශ්‍රායෙල් ජනතාවගේ ප්‍රථම රජු සාවුල් වූ අතර විවිධ හේතු මත සාවුල් රජ දවිත් කෙරෙහි ඊර්ෂ්‍යාවෙන් පසුවිය. එබැවින් සාවුල් රජ දවිත් මරණයට පත් කිරීමට පවා උත්සාහ දැරී ය. ඉන් මිදීමට දවිත් පාළුකරයේ සැඟවී සිටියේ ය.
- දවිත් එන්ගෙදියේ පාළුකරයේ සිටින බව දැනගත් සාවුල් ඇතුළු පිරිස දවිත් විනාශ කිරීමට ලුහු බැන්දේ ය.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

- දාවිත්ට සාවුල් එන්ගෙදියේ ගුහාවේ දී හමු වූ අතර එවිට සාවුල් විනාශ කිරීමට සුදුසු අවස්ථාවක් දාවිත්ට උදා විය.
- එහෙත් දාවිත් සාවුල් විනාශ නොකොට සාවුල්ගේ සළුවේ කොන රහසින් කපා ගත්තේ ය. එහෙත් ඔහුගේ සිත එම ක්‍රියාව පිළිබඳ ව පවා දොස් තැබී ය.
- දාවිත් සිය සෙනඟට කතා කොට "සමිඳාණන් වහන්සේගේ අභිෂේකය ලත් තැනැත්තාට එනම් සාවුල්ට කිසිදු අනතුරක් කිරීමෙන් වළකින ලෙස නියම කළේ ය.
- සාවුල් ගුහාවෙන් පිට ව ගිය පසු දාවිත් ඔහු අමතා "මාගේ ස්වාමීනි, රජ්ජුරුවන් වහන්ස", යැයි අමතමින් හඬ ගැසී ය. තව ද දාවිත් සාවුල් ඉදිරියේ මුණින්තලා වී වැඳ "මාගේ ස්වාමියා, සමිඳාණන් වහන්සේගේ අභිෂේක ලත් තැනැත්තා බැවින් ඔහුට විරුද්ධ ව මාගේ අත ඔසවන්නේ නැතැ'යි යටහත් පහත් ලෙස පැවසී ය. තව ද ඔහුට විරුද්ධ ව කිසි නපුරක් කිරීමට අදහස් නොකරන බව ද පැවසී ය.
- දාවිත්ගේ වචන ඇසූ සාවුල් "දාවිත් මාගේ පුත්‍රයා ඔය ඔබේ හඬ දැයි" අසමින් ශබ්ද නගා හැඬුවේ ය.
- අනතුරුව "ඔබ මට වඩා දැහැමි ය" යයි පවසමින් දාවිත්ගේ දැහැමි බව සාවුල් පිළිගත්තේ ය. සාවුල් තව දුරටත් කතා කරමින් "මා ඔබට නපුර කළ නමුත් ඔබ මට යහපත කළෙහි ය" යනුවෙන් පවසමින් සමිඳාණන් වහන්සේගේ කරුණාව දාවිත් කෙරෙහි පැතී ය.

## දාවිත් රජ හා මෙපිබොෂෙත්

- පසුකාලීන ව සාවුල් රජු හා ඔහුගේ පුත් ජොනතන් සටනක දී පරාජය වීම හේතුවෙන් මරණයට පත්විය.
- සාවුල්ට පසුව දාවිත් ඊශ්‍රායෙල් සෙනඟගේ රජ බවට පත් විය.
- සටනක දී පරාජය වූ රාජ පරම්පරාවේ සියලු දෙනා විනාශ කිරීම එකල සාමාන්‍ය සිරිත වුවත් දාවිත් සාවුල්ගේ වංශයට අයත් තම මිතුරු ජොනතන්ගේ පුත් මෙපිබොෂෙත්ට කරුණාව දක්වීය.
- තව ද සාවුල්ගේ ගම්බිම්, අයිතිය පමණක් නොව දාවිත් සමග රජ මැඳුරේ භෝජන සංග්‍රහයේ එකට හිඳ කෑම අනුභව කිරීමට ද අවස්ථාව මෙපිබොෂෙත්ට හිමි විය.
- රජ පෙළපතට අයත් පවුලේ අය පමණක් එකට හිඳ කෑම අනුභව කිරීම එකල සිරිත වූ නමුත් ජොනතන්ගේ පුත් මෙපිබෝෂෙත්ට එසේ ආරාධනා කිරීමෙන් දාවිත් මෙපිබොෂෙත් තම පුත්‍රයා සේ සැලකුවේ ය.
- මෙපිබොෂෙත්ට ශාරීරික දුබලතා පැවතියත්, ඔහුගේ ජීවිතයට වටිනාකමක් ලබා දෙමින් ඔහු ආදරයෙන් රැකබලා ගනිමින් දාවිත් රජ අන් අයට ද ආදර්ශයක් විය.

මෙලෙස දවිත් කෙරෙන් ධර්මිෂ්ඨකම මැනවින් ප්‍රකාශ වූ අවස්ථා ලෙස

★ එන්ගෙදියේ දී සාවුල්ගේ ජීවිතය මිදීමත්

★ මෙපිබොෂෙත්ට කරුණාව දැක්වීමත් පෙන්වා දිය හැකි වේ.

ඒ අනුව දවිත්ගේ ජීවිත පැවැත්ම තුළින් පිළිබිඹු වූ යහපත් ගුණාංග මෙලෙස හඳුනාගත හැකි වේ.

**දවිත්**

- සාවුල් දෙවියන් වහන්සේ විසින් කැප කරන ලද පුද්ගලයකු ලෙස පිළිගනු ලැබ ඔහු කෙරෙහි විශේෂතාවක් දැක්වී ය
- දේව භය ඇති ව ක්‍රියා කළේ ය
- යටහත් පහත් ව ක්‍රියා කළේ ය
- පළි ගැනීම වෙනුවට ප්‍රේමයෙන් ක්‍රියා කළේ ය
- නිවැරැදි දේ කෙරෙහි හිත යොමු කළේ ය
- දැහැමි ජීවිතයක් ගත කළේ ය
- කාරුණික දිවි පෙවෙතක් ගත කළේ ය
- කමාව ලබා දුන්නේ ය
- අන් සතු වස්තුව පැහැර නොගත්තේ ය
- අන් සතු ජීවිත සුරැකීමට ක්‍රියා කළේ ය
- තම රජකම තුළින් ලද බලයට තම සිත පාලනය කරන්නට නොදී, දෙවියන් වහන්සේට අයත්වූවකු සේ ක්‍රියා කළේ ය.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

මෙලෙස දවිත් එදා ධාර්මිෂ්ඨ ව ක්‍රිය කළා සේ කිතුනු අප ද ධාර්මිෂ්ඨ ව ක්‍රියා කිරීම අපේක්ෂා කෙරේ. අප ද අන් අයගේ ජීවිත විනාශ කිරීමට නොව සුරැකීමට ක්‍රියා කිරීමත් එසේ ක්‍රියා කිරීමේ දී අප හා එකඟ ව ක්‍රියා කරන්නන් මෙන් ම අපට විරුද්ධව නැගී සිටින්නන් වෙනුවෙන් ද එක හා සමාන ව කරුණාව දක්වීමේ හදවතක් තිබීමත් අවශ්‍ය වේ. එමෙන් ම තමා සුරක්ෂිත වන්නා සේ යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් පසුවන අය මෙන් ම විශේෂ අවශ්‍යතා ඇති අය ද සුරක්ෂිත කිරීමට කැප විය යුතු වේ. එලෙස යහපත ඉටු කිරීමෙන් ධාර්මිෂ්ඨ සමාජයක් ගොඩ නැගීමට එකමුතු ව ක්‍රියා කරමු.

**ක්‍රියාකාරකම**

1. දවිත් සතු ව තිබූ යහපත් ගුණාංග ඉස්මතු වූ අවස්ථා ලියා දක්වන්න.
2. කිතුනු දරුවකු ලෙස ඔබ සමග සිටින්නන් හට ප්‍රේමයෙන් ක්‍රියා කළ හැකි අවස්ථා **තුනක්** විස්තර කරන්න.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.